# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල



| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.19 පැය 1550 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/779/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>**

## 01. නාඳුනන මෘත ශරීරයක් හමුවීම - හලාවත පොලිස් වසම.

2025.04.19 වන අද දින උදෑසන කාලයේ හලාවත පොලිස් වසමේ හලාවත මෝය අසල මුහුදු තීරයට නාඳුනන පිරිමි මළ සිරුරක් ගොඩ ගසා ඇති බවට හලාවත පොලිසියට ලද පණිවිඩයක් අනුව විමශර්න ආරම්භ කර ඇත. මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.

**වයස අවුරුදු 60 ක් පමණ පෙනුමැති උස අඩි 05 අඟල් 04 ක් පමණ, වැඩුණු තළෙළු සිරුරක් හිමි පුද්ගලයෙක් වන අතර සුදුපාට හිසකෙස් කොටට කපා, උඩුකයට අත්දිග කොළපාට කමිසයක් හැඳ සිටී. යටි කය නිවර්ස්ත්‍ර පුද්ගලයෙකි. මුහුදේ ගල්වල වැදී සිදු වූ තුවාල බවට සැක සිතිය හැකි තුවාල කිහිපයක් මුහුණේ දක්නට ඇත.**

මෘත ශරීරය හලාවත රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. හලාවත පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 02. වන අලි පහරදීමකින් පුද්ගලයෙකු මිය යාම - හොරොව්පොතාන.

2025.04.19 වන අද දින අළුයම් කාලයේ හොරොව්පොතාන පොලිස් වසමේ සියඹලාව ඇළපැත්තවැව ප්‍රදේශයේ වන අලි පහරදීමකින් තුවාල ලැබූ පුද්ගලයෙකු ප්‍රතිකාර සඳහා හොරොව්පොතාන රෝහලට ඇතුලත් කිරීමේදී මිය ගොස් ඇති බවට හොරොව්පොතාන පොලිසියට ලද තොරතුරක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 44 ක් වූ මොරකැව, හොරොව්පොතාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තම නිවසේ සිට අළුයම් කාලයේ නිවසින් පිටතට පැමිණි අවස්ථාවේදී නිවස ඉදිරිපිට රැඳී සිටි වන අලියෙකු මෙම පහරදීම සිදු කර ඇති බවට දැනට සිදු කරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇත. හදිසි මරණ පරීක්ෂණයෙන් පසු මෘත දේහය ඥාතීන්ට භාර දී ඇත. හොරොව්පොතාන පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - නිට්ටඹුව පොලිස් වසම.

2025.04.19 වන අද දින උදෑසන කාලයේ නිට්ටඹුව පොලිස් වසමේ රණවිරුගම මාගර්යේ පුද්ගලයෙකු යතුරුපැදියක්ද සමඟ වැටී සිටින බවට නිට්ටඹුව පොලිසියට ලද පණිවිඩයක් අනුව නිලධාරීන් කණ්ඩායමක් විසින් තුවාලකරු වතුපිටිවල රෝහලට ඇතුලත් කිරීමේදී මිය ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 32 ක් වූ නිට්ටඹුව, රුක්ගහවිල ප්‍රදේශයේ පදිංචි විශේෂ කායර් බලකා පොලිස් කොස්තාපල්වරයෙකි.**

මරණකරු 2025.04.18 වන දින රාත්‍රී කාලයේ නිට්ටඹුව පොලිස් වසමේ ආයෝජන කලාප මාගර්යේ යතුරුපැදියෙන් තම නිවස දෙසට ගමන් කරමින් සිටියදී එහි හතරමං හන්දියේ මාගර්යේ වම් පස අයිනේ තිබූ දුරකථන කණුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරෙන් තුවාල ලබා එම ස්ථානයේම වැටී සිටියදී 2025.04.19 වන අද දින උදෑසන කාලයේදී ප්‍රදේශවාසීන් දැක නිට්ටඹුව පොලිසිය දැනුවත් කිරීමට කටයුතු කර ඇති බවට සිදු කරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය වතුපිටිවල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. නිට්ටඹුව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**